# වෛරයෙන් ඡන්දය දීම: ශ්‍රී ලංකාවේ 2015 පාර්ලිමේන්තු මැතිවරණය ආශ්‍රිත ෆේස්බුක් වෛරී කථනය පිළිබඳ අධ්‍යයනයක්

**සම්පූර්ණ වාර්තාව සඳහා බලන්න** [http://www.cpalanka.org/voting-in-hate-a-study-of-hate-speech-on-facebook-surrounding-sri-lankas-parliamentary-election-of-2015/](http://www.cpalanka.org/voting-in-hate-a-study-of-hate-speech-on-facebook-surrounding-sri-lankas-parliamentary-election-of-2015/)

## විධායක සාරාංශය


'වෛරයෙන් ඡන්දය දීම' යනු ශ්‍රී ලංකාවේ 2015 පාර්ලිමේන්තු මැතිවරණය ආශ්‍රිත ඔන්ලයින් වෛරී කථනය පිළිබඳව කෙරෙන අධ්‍යයනයකි. එය සමාජ මාධ්‍යය තුළ සිදු වන වෛරී හා අන්තරායකර කථනයේ වැඩීම හා බලපෑම් විමසා බලමින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ප්‍රකාශයට පත් කෙරෙන අධ්‍යයනයන් මාලාවක තුන් වැන්න යි. 2015 පාර්ලිමේන්තු මැතිවරණයේ දී ශ්‍රී ලංකාව තුළ නව වර්ධනයක් දක්නට ලැබිණ: සමාජ මාධ්‍යය දේශපාලන උද්ඝෝෂණයේ දී හා මැතිවරණය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල දී මෙවලමක් ලෙස යොදා ගැනිණ. සමාජ මාධ්‍ය වේදිකාවන් අතරින් වඩාත් ම භාවිතයට ගැනුණේ ෆේස්බුක් අඩවිය යි. සමාජ මාධ්‍යය තුළ දී අදහස් පළ කිරීමේ නිදහස වඩාත් නිදහසේ භාවිත කළ හැකි වීම ද අපේක්ෂකයන් ඉලක්ක කර ගත් වෛරී හා අපවාදාත්මක තොරතුරු පරීක්ෂාවකින් තොරව ප්‍රකාශයට පත් වීමට හේතු විය. නව වාර්තාව 2015 පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වූ අගෝස්තු 17 දිනට පෙර මාසය තුළ ෆේස්බුක් කණ්ඩායම් 11ක ක්‍රියාකාරිත්වය විමසා බලයි. මෙහි දී අදාළ තැපැල් කිරීම් හා ඒවාට දැක්වූ ප්‍රතිචාර හසු කර ගෙන ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරන ලදි. අධ්‍යයනයේ සොයා ගැනීම්වලින් අනාවරණය වන්නේ ෆේස්බුක් කණ්ඩායම් අත්පත් කර ගෙන පළ කළ අදහස් දේශපාලනික කථනයන් වූයේ අර්ධ වශයෙන් බව යි; ඒවා අපේක්ෂකයන්ගේ ජනවාර්ගිකත්වය, ආගම හා ස්ත්‍රී-පුරුෂ භාවය ඉලක්ක කර ගෙන වෛරී කථනය ප්‍රවර්ධනය කළ බව යි; අපේක්ෂකයන්ගේ දේශපාලනික අනුබද්ධකම් සැලකිල්ලට ගත්තේ අඩු මට්ටමකින් බව යි. මෙම අධ්‍යයනය මැතිවරණයට ඔන්ලයින් වෛරී කථනය අදාළ වූ තරම ද මැතිවරණ ප්‍රතිඵලයට එය කළ බලපෑමේ තරම ද විමසා බැලුවේ ය. ඡන්ද දායකයන්ගේ මනාපය කෙරෙහි එය සැලකිය යුතු බලපෑමක් කළ බවක් අධ්‍යයනයේ සොයා ගැනීම්වලින් අනාවරණය නො වේ. එසේ වුව ද, ඔන්ලයින් ක්‍රමයෙන් වර්ගවාදය, අන්තවාදය හා ස්ත්‍රී-පුරුෂවාදය පදනම් කර ගත් වෛරී කථනය පරීක්ෂාවට ලක් නො වී ප්‍රකාශයට පත් වීමෙන් ඇති වන බරපතළ බලපෑම්වලට ගොදුරු වන තරුණ අනුගාමිකත්වය එන්න එන්න ම වර්ධනය වන බව එම සොයා ගැනීම්වලින් අනාවරණය වේ. අධ්‍යයනයේ සොයා ගැනීම්, සමාජ මාධ්‍යය තුළ සිදු වන මැතිවරණ උද්ඝෝෂණයේ දී වෛරී කථනය වැඩි වැඩියෙන් යොදා ගනු ලැබීමට විසඳුම් වශයෙන් අනාගතයේ දී රාජ්‍යය, අපේක්ෂකයන් හා පොදුවේ සමාජය විසින් ගත යුතු පියවරයන් නිර්දේශ කරයි.

- මැතිවරණ උද්ඝෝෂණය සඳහා රැස්වීම්වලින් හා සාම්ප්‍රදායික මාධ්‍යයෙන් තරම් ම අවකාශයක් ඔන්ලයින් ක්‍රමයෙන් ද නිර්මාණය වන බව ගැන ආණ්ඩුව, මැතිවරණ කොමිසම, දේශපාලන නායකයන් හා අපේක්ෂකයන් දැනුවත් විය යුතු ය.
- අපේක්ෂකයන්ට හෝ පොදු ජනතාවට ඔන්ලයින් අපයෝජනය හා වෛරී කථනය වාර්තා කළ හැකි වාර්තාකරණ යන්ත්‍රණයක් මැතිවරණ කොමිසම විසින් ඇති කළ යුතු ය. ෆේස්බුක් අඩවිය වෛරී කථනයට එරෙහි ප්‍රතිපත්තියක පිහිටා සිටින බැවින්, එවිට මැතිවරණ කොමිසමට සාපරාධී ෆේස්බුක් පිටුව විමර්ශනයකට ලක් කොට එය වසා දමන ලෙස ෆේස්බුක් අඩවියට වාර්තා කළ හැකි ය.
- සාපරාධී තොරතුරු ඉස්මතු කර දක්වමින් සාපරාධී කණ්ඩායම් වසා දමන ලෙස වාර්තා කිරීමට සමාජ මාධ්‍යය නිරීක්ෂණය කරන විට දේශපාලන පක්ෂවලට ප්‍රායෝගිකව එම කටයුත්ත කළ හැකි විය යුතු ය.

වෛරය කථනය ප්‍රවර්ධනය කරන ෆේස්බුක් පිටු වසා දැමූ විට ඒවා නව ගිණුම් නාමයක් යටතේ යළි කරළියට පැමිණිය හැකි ය. එහෙයින්, ඉහත සඳහන් ආකාරයේ මැදිහත් වීමක් කෙරෙන්නේ නම්, කිසි සේත් ඉවසා නොදැරෙන බවට පැහැදිලි පණිවුඩයක් යවමින් වෛරී කථනය ප්‍රවර්ධනය කිරීම යම් තාක් දුරකට හෝ අධෛර්යමත් කළ හැකි වන්නේ ය.

- දේශපාලන අපේක්ෂකයන් විසින් යහපත් ඔන්ලයින් කතිකා ක්‍රමයක් ලෙස සලකා ෆේස්බුක් වැනි අන්‍යෝන්‍යව ක්‍රියාකාරී සමාජ මාධ්‍ය අවකාශයන් යොදා ගත යුතු ය; එමගින්, පොදු ජනතාව සමග අන්‍යෝන්‍ය වශයෙන් සන්නිවේදනයේ යෙදෙන්නා වූත් පොදු ජනතාවට සිය දුක් ගැනවිලි ශිෂ්ට සම්පන්න ආකාරයෙන් ප්‍රකාශයට පත් කිරීමට හා අපේක්ෂකයන්ට තැපැල් කිරීම් ඔස්සේ ඒවාට ප්‍රතිචාර දැක්වීමට හැකි වන්නා වූත් ද්විමාර්ගික ඔන්ලයින් සන්නිවේදනයක් ඇති කළ යුතු ය.

තව මත් වෛරී කණ්ඩායම්වල ග්‍රහණයට හසුව නොමැති විය හැකි සූක්ෂ්මාත්මතාවෙන් යුතු තරුණයන් තුළ ධනාත්මක සමාජ මාධ්‍ය සම්බන්ධය හා සංවාදය වගාදිගා කරමින් පරිපාලකයා විසින් වෛරී කථනයට හෝ අසභ්‍ය සාහිත්‍යයට සමාන අදහස් දැක්වීම් හෝ තැපැල් කිරීම් මකා දැමිය හැකි ය.

වාර්තාව අවසන් වන්නේ, මීට පිළිතුර වනුයේ ඔන්ලයින් අවකාශය සීමා කිරීම නො ව විනීත හා සාමකාමී සම්බන්ධය සඳහා පවතින ඔන්ලයින් අවකාශය පුළුල් කිරීම බව සඳහන් කරමිනි.